# සාම්ප්‍රදායික කුඹුරු ගොවිතැන හා බැඳි අස්පර්ශිත උරුමය (තලාකුඹුර ගම්මානය ඇසුරෙන්)

ජී.එච්.පී.එස් ලක්මාලී[1], එච්.බී.එස්.පී. කුමාරිහාමි[2]

ප්‍රමුඛ පදඃ අස්පර්ශිත උරුමය, කුඹුරු ගොවිතැන, අතීත දැනුම සහ සම්ප්‍රදාය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය, සහ සංස්කෘතික පැවැත්ම ගොඩනැගීමේදී කුඹුරු ගොවිතැන ප්‍රධානම සාධකය විය. එය හුදෙක් ආහාර නිෂ්පාදන ක්‍රියාවලියක් පමණක් නොව, දේශීය දැනුම් සම්භාරයක්, සම්ප්‍රදායික චාරිත්‍ර වත්පිළිවෙත්, සහ සමූහික ජීවන රටාවක් සමග බද්ධ වූ අස්පර්ශනීය උරුමයක් විය. මෙම අස්පර්ශිත උරුමයට අස්වනු නෙළීමෙන් පසු පැවැත්වෙන පුද පූජා, සහ කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිත කළ පාරම්පරික ශිල්පීය ක්‍රමෝපායන් අයත් වේ. නූතන තාක්ෂණය සහ ජීවන රටාවේ වෙනස්කම් හේතුවෙන් මෙම වටිනා උරුමය ක්‍රමයෙන් අභාවයට යමින් පවතී. මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් තලාකුඹුර ගම්මානයේ අතීත කුඹුරු ගොවිතැන හා බැඳුණු අස්පර්ශනීය උරුමයේ විවිධ අංග හඳුනාගැනීම, ඒවායේ වැදගත්කම විශ්ලේෂණය කිරීම, සහ ඒවා අදටත් පවත්වාගෙන යන්නේ කෙසේද යන්න පිළිබඳව සොයා බැලීම, දැනුම සහ සම්ප්‍රදායන් පිළිබඳව සාකච්ඡා කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණයි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලදී. එහිදී මූලික වශයෙන් සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යනය ද ක්ෂේත්‍ර අධ්‍යනය තුළදී නිරීක්ෂණය සහ සහභාගීත්ව පරීක්ෂණය සිදු කරන ලදී. අවසානයේ දත්ත විශ්ලේෂණය කර එම දත්ත ඡායාරූප, වීඩියෝගත කිරීම, සහ ලේඛනගත කිරීම සිදු කරන ලදී.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

කුඹුරු වැඩ ආරම්භ කරනුයේ නැකැත් බැලීමෙනි. ගමේ සියලුම ගොවීන් එකම දවසක නැකතට වැඩ ඇල්ලීම සිදු කරනු ලබයි. මෙය සාමූහික කාල කළමනාකරණයේ වැදගත් මානව විද්‍යාත්මක ලක්ෂණයකි. මෙහි දී අමුණු සුද්ද පවිත්‍ර කර අස්කොන් බිඳීම සිදු කරනු ලබයි. මී ගවයන් යොදා ගනිමින් සී සෑම සිදු කරන හීකරුවා නමින් හඳුන්වන පුද්ගලයා විසින් අඩහැර පාමින් සී සෑම සිසානු ලැබේ. තවාන් දැමීම සඳහා බිත්තර වී සූදානම් කර ගැනීම සුවිශේෂී වේ.

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
hansisaummya@gmail.com

දින තුනක් ඉක්මගිය පසු ගේ බිම තුළ කෙසෙල් කොළ අතුරා ඒ මත වී හොඳින් මට්ටම් කර අතුරමින් නැවත ඒවා කෙසෙල් කොළ වලින්ම වසනු ලැබේ (වී මළුවේ දැමීම). විද්‍යාත්මකව මෙය බීජ වල ප්‍රරෝහණ හැකියාව ඉහළ නැංවීමට යොදාගත් ස්වභාවික ආර්ද්‍රතා හා තාපන පාලන ක්‍රමවේදයක් ලෙස විග්‍රහ කළ හැකිය. තවද, සුභ දවසක් සහ කරණ බැලීම (සතුන් වැඩි පුරම හානි කරන වෙලාවන්) සිදු කරනු ලබයි. මරු සිටින දිශාව බැලීමෙන් පසු එම දිශාවට පිටුපා වැඩ ආරම්භ කිරීම, ස්වභාවික බලවේගයන්ට ගරු කරමින් ආරක්ෂාව තහවුරු කරන සංකේතාත්මක චාරිත්‍රයක් ලෙසින් හඳුනාගත හැකිය.

මුලින්ම කොස් අත්තක් සහ අලකොළ ගසක් ගෙන නියර මත සිටුවා සුදු රෙදි කඩකින් හිස ආවරණය කරගෙන තවාන් ලියද්දට වී ඉසීම සිදු කරනු ලබයි. වැඩ අවසන් වූ පසු ලියද්දට වැඳීම මෙම ගම්වැසියන් සතු සිරිතකි. අවසන කුඹුරු හිමියා විසින් දිය දෝතක් ගෙන ඉසීමෙන් පසු දණගසා වැඳ තමන්ගේ කුඹුර ආරක්ෂා කර දීම පොළොව හාමුදුරුවන්ට (මිහිකත දෙවියන්ට) බාර කිරීම සිදු කරනු ලැබේ. මෙයින් ගොවිබිම හුදෙක් නිෂ්පාදන අවකාශයක් නොව, පූජනීයත්වයක් ආරෝපණය කරනු ලබයි. දින විස්සක් පමණ ගිය පසු තවානේ ගොයම් පැළ ගැලවීම සඳහා කාන්තාවන් විශේෂ වේ. අත්තම් ක්‍රමයටත්, හැඳුනුම්කමටත් ගොයම් පැළ ගැලවීමට සම්බන්ධවීම මොවුන්ගේ සිරිතකි. මෙය ස්ත්‍රී පුරුෂ ශ්‍රම විභජනය සහ සාමූහිකත්වය ප්‍රදර්ශනය කරයි. ගොයම් පීදෙන කාලය වන විට එරමිණියා කටු අත්තක් ගෙන ලියද්දෙන් ලියද්දට ඇදගෙන යෑම සිදු කරනු ලබයි. එවිට මැස්සන් කුඹුරු අතහැර යන බව මතය වේ. මෙය රසායනික ද්‍රව්‍යවලින් තොරව පලිබෝධ පාලනය කළ දේශීය ජෛව යාන්ත්‍රික ක්‍රමවේදයක් ලෙස විද්‍යාත්මකව වැදගත් වේ.

තමාගේ ගොයම් කයියට සහභාගී වන පුද්ගලයන්ට සංග්‍රහ කිරීමේ ද ගම්වාසීන් සතු සිරිතකි. විට මල්ල මෙහි අනිවාර්ය අංගයකි. මෙම සංග්‍රහයන් තුළින් (උදා: කිරිබත්, කැවුම්, කුරක්කන් රොටී, මැල්ලුම) ශ්‍රමය වෙනුවට අන්‍යෝන්‍යභාවය මත පදනම් වූ ආර්ථික ක්‍රමවේදයක් සහ දේශීය ආහාර භාවිතය පිළිබිඹු කරනු ලැබේ. අලුත් සහල්, පරිභෝජනයට පෙර බුදුන්ට පූජා කර සිටීම මෙහි ගම්මුන්ගේ සිරිතකි. මුලින්ම කිරි ආහාර දානය පූජාකරන අතර ගමේ සියලුම කුඹුරුවල වැඩ අවසන් වූ පසු අලුත් සහල් එකතු කර ගනිමින් දේව දානය පුදනු ලැබේ. ගොඩ කමත නමින් හඳුන්වන කමතේ පහන් පැල් සාදන අතර ගමේ දේවාලයේ කපු මහතා විසින් තමන්ගේ භව භෝග ආරක්ෂා කර දුන්නාට මිහිකත දෙවියන් වෙත පින් දෙමින් ස්තුති කිරීම සිදු කරයි. මේ සඳහා බදාදා හෝ සෙනසුරාදා යන දිනයන් තෝරා ගනී.

## සමාලෝචනය

සාම්ප්‍රදායික කුඹුරු ගොවිතැන හුදෙක් ආර්ථික ක්‍රියාවලියක් පමණක් නොව, එයට ආවේණික වූ වටිනා අස්පර්ශිත උරුමයන් සමූහයක් ඇති බව හෙළි විය. මෙම අධ්‍යයනය මඟින් තහවුරු වූයේ ගොවිතැන් චාරිත්‍ර තුළින් විද්‍යාත්මක හා

මානව විද්‍යාත්මක අගයන් අන්තර්ගත වන බවයි. මෙම ගොවිතැන් කටයුතු හා බැඳුණු සියලු චාරිත්‍ර වාරිත්‍ර, පිළිවෙත් මගින් ගම්මුන් අතර සහයෝගීතාව, සුහදත්වය සහ සාමූහිකත්වය ශක්තිමත් වී ඇත. එපමණක් නොව, මේ හා බැඳුණු චාරිත්‍ර තුළින් මිනිසා හා ස්වභාවධර්මය අතර පූජනීය බැඳීමක් බවට පත් වී ඇත. සම්ප්‍රදායික ශිල්ප ක්‍රම දේශීය කෘෂි විද්‍යාත්මක දැනුමේ කොටසක් වන අතර, එය රසායනික භාවිතයෙන් තොරව පාරිසරික අභියෝග කළමනාකරණය කිරීමේ තිරසාර හැකියාව පෙන්නුම් කරයි. දේශීය දැනුම, අත්දැකීම් සහ ජීවන රටාව පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යන ආකාරය මෙම අධ්‍යයනයෙන් පැහැදිලි විය. කෙසේ වෙතත්, නූතන සමාජයේ බලපෑම් හමුවේ මෙම සාම්ප්‍රදායික ක්‍රමවේද ක්‍රමයෙන් යටපත් වෙමින් පවතී. එම නිසා, මෙම අස්පර්ශිත උරුමය ආරක්ෂා කරගැනීමට අත්‍යවශ්‍ය වන්නේ සාම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර, දැනුම සහ ශිල්ප ක්‍රම විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක දෘෂ්ටියකින් ලේඛනගත කිරීම සහ අනාගත පරපුර වෙත ගෙන යාමයි.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ගුණවර්ධන, ප්‍රියශාන්ත. (2004). ***පුරාණ ගම.*** කොළඹ: සමන්ති ප්‍රකාශකයෝ.

විජේසේකර, නන්දදේව. ***ලංකා ජනතාව.*** ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.